


# ලෝකාන්ත චාරිකාව

**T.M.K. සිතුමිණි බණ්ඩාර**

**5 – D**

කතෘගේ නම - T.M.K. සිතුමිණි බණ්ඩාර (5 – D)

කතෘගේ වෙනත් කෘති

- ❖ පොකුණේ ආගන්තුකයා
- ❖ සරුංගලය

කෘතිය පල කරන දිනය - 2025 පෙබරවාරි 08

ISBN අංකය - 978-624-208-354-4

**පිදුම**

**ආදරණීය**

**මහාමායා**

**මාතාවට**

**සෙනෙහසින් !**

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ජෙද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලිය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතිත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **“හෙරණගත්කරණී”** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සදහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

පාසල් නිවාඩු කාලයේ දී අපේ පවුලේ හැමෝම නුවරඑළියේ යන්න සැලසුම් කළා. ග්‍රෙගරි වැව, වික්ටෝරියා උයන නරඹන්න හැමෝම ආසයි. ඒ වාගේම ලෝකාන්තය බලන්නත් යෝජනා වුණා. මොකද දන්නවාද පවුලේ ගොඩක් අය ලෝකාන්තය නරඹලා නැති නිසා.

ඉතිං අපේ ගෙදර හැමෝටම, පවුලේ නෑදෑයින් සමග කතාවෙලා චාරිකාවට දිනයක් යොදා ගෙන ගමන සැලසුම් කළා.



**චාරිකාව දිනයේ අපි ගම්පොලින් පිටත් වෙන විට උදේ 6.00 යි. යන අතර මග පුස්සැල්ලාව නගරය පසු කළා. තවලන්තැන්න නගරයට කිට්ටුවෙන් හනුමන්තා කෝවිලත් පසු කළා. ඇතින් මහවැලි මහා සැය දර්ශනය වුණා. කොත්මලේ ජලාශයත් අපට දැක ගනන්නට හැකි වුණා. ඒ අතර ලස්සන තේ වතු , දිය ඇළිත් දුටුවා. හරිම ලස්සනයි.**



නුවරඑළියට කිට්ටු වෙන්න තේ කර්මාන්තශාලා සෑම තැනම. රම්බොඩ, ලබුකැලේ ඒ අතර ප්‍රසිද්ධයි. ලස්සන මල් වගේම, එළවලු විකුණන නංගිලා, මාමලා, නැන්දලා, පාර දෙපැත්තේ පිරිලා.



නුවරඑළියේ ග්‍රෙගරි වැව ළඟදි, අපි ග්‍රෙගරි වැවේ සුන්දරත්වය සිසිලස විදිමින් උදේ ආහාරය ලබා ගත්තා. එදා නම් අපට එතරම් සීතලක් දැනුනේ නෑ. ඒ වාගේම අපට පෝනියෙකුගේ පිටේ රවුමක් යන්නත් අවස්ථාවක් ලැබුණා. ඒක මට අමතක නොවන සිදුවීමක්.



උදේ ආහාරයෙන් පසු අපි ලෝකාන්තයට යන ගමන් මාර්ගයට පිවිසුණා. එහි යන විට අපට ඈතින් ලංකාවේ උසම කන්ද වන පිදුරුතලාගල කන්ද ත් දක්නට ලැබුණා.නගරය වටා කඳු පිරිලා. හරිම ලස්සනයි. ඒ වාගේම මධ්‍යම පළාතේ ජාතික පුෂ්පය වන මහරත්මල් ශාකය නුවරඑළියේ සෑම තැනම වගේ ද්නට ලැබුණා.

එළවලු කොටු වගේම පාට පාට ලස්සන මල් සෑම තැනම. නුවරඑළියේ ගස් උස නෑ. ඒ එහි සුළඟ වැඩි හින්දාලු. ගස් එකිනෙකට එතිලා. ගස්වල කොළ කුඩායි.



නුවරඑළියෙන් අපි අඹේවෙල මාර්ගයට පිවිසුණා. ඒ වගේම අතර මගදී නවසීලන්ත ගොවිපලට යන මාර්ගයත් පසු කළා. හයිලන්ඩ් කර්මාන්ත ශාලාවත් ඒ අතර පසු කළා. ඒ වාගේම ලංකාවේ උසම දුම්රිය ස්ථානය වන පට්ටිපොල දුම්රිය ස්ථානයත් අපි පසු කළා.



ඉතින් අපි හෝටර්න් තැන්න ප්‍රදේශයට යන විට උදේ 11.45 පමණ වුණා. ප්‍රවේශ පත්‍ර මිලදී ගැනිමෙන් පසුවයි එහි ගමන් ඇරඹුවේ. ඒ යන මගදි අපට ශ්‍රීපාදයත් ඇතින් දර්ශනය වුණා.

ලෝකාන්තයට යන විට පොලිතීන්, ප්ලාස්ටික් බෝතල් ආදිය අරගෙන යන්න බෑ. ආරක්ෂක නිලධාරින් අපව පරීක්ෂා කර අප ගෙන ගිය බිස්කට් පැකට්වල දවටන ඉවත් කර ,බිස්කට් ටික කඩදාසි මල්ලකට දමා රැගෙන යාමට අපට සිදු විය.


එම පරික්ෂාව සිදු කළේ ලෝකාන්තය සොයා ගත් බේකර්ස් සාමිගේ බංගලාවේ සිටයි. එය කෞතුකාගාරයක් වාගෙයි. ලෝකාන්තයේ දි නරඹන්න පුළුවන් සත්තුන්ගේ, මල් වල, ශාක වල රූප වාගේම දර්ශනිය ස්ථාන වල රූප ත් එහි ප්‍රදර්ශනය කර තිබෙනවා.

බේකර්ස් සාමිගේ බංගලාවේ උදුනද තාම ඒ ලෙසටම ආරක්ෂිතව තිබෙනවා. පෙනෙන තෙක් මානයේ තැනිතලාව හරිම සුන්දරයි.අපව පරීක්ෂා කිරීමෙන් පසු පසෙක අප යා යුතු පිවිසුම් මාර්ගය ප්‍රදර්ශනය කර තිබිණි. ඒම ස්ථානයේ සිට කි.මී. 7 දුරක් කිරිගල්පොත්ත කන්දට ඇති බවත් සටහන් පුවරුවක් දුටුවා.



මේ ලෙසට මාර්ග දෙකකින් ලෝකාන්තයට යන්න පුළුවන්. අපි මුලින්ම ගියේ බේකර්ස් දිය ඇල්ල බලන්න. බේකර්ස් දිය ඇළි කොමළිය බෙලිහුල්ඔය පෝෂණය කරන බවත්, විවිධ අනුවර්තනය පෙන්වන ජලජ ජීවීන් ද එහි සිටින බවත් දක්වා පුවරුවක් ප්‍රදර්ශනය කර තිබුණා.

මීවන ශාක මෙන්ම මේ ප්‍රදේශයට ආවේණික කුරු කටුසු වර්ගද බහුල බවත් පුවරුවේ සදහන් වී තිබුණා.




බේකර්ස් ඇල්ල නැරඹීමෙන් පසුව අපි ලෝකාන්තය බලන්න පිටත් වුණා. ඒ යන අතර මග පොඩි පොඩි කදු ගැට , තැනිතතලා ප්‍රදේශත් පසු කළා.මීදුම එන්න කලින් ලෝකාන්තයට යා යුතු බව අප්පච්චි පැවසුවා. නැත්නම් ලෝකාන්තය බලන්න බැරි බව ත් පැවසුවා.



ඔන්න අපි ලෝකාන්තය ළගට ආවා. අප්පච්චි කී ලෙසටම මීදුමෙන් වැසුනු දසුනක් තමයි අපට නරඹන්න සිදු වුණා.ඒක මීටර් 870 ක් උස බෑවුමක්. පසුව අපි කුඩා ලෝකාන්තය නරඹන්න පිටත් වුණා. එහි මීටර් 240 ක බෑවුමක්. එතනත් මීදුම. සෑම තැනම ලෝකාන්තය නැරඹීමේදි ප්‍රවේශම් විය යුතු උපදෙස් පුවරු. ඒ වාගේම ලෝකාන්තයේ ලේන්නු කලු පාටට හුරුයි. පහල බෑවුම බලංගොඩ නගරයලු. නැවත අපි එන විට කළු වඳුරෙකුත් දැක්කා.




**10 කි.මී. දුරක ගමන අවසන් කළ අපි අපේ බස් රථය වෙත පැමිණෙන විට සවස 4.45 ට පමණ වුණා.එම ස්ථානය මධ්‍යම පළාතෙයි , ඌව පළාතෙයි පළාත් මායිම. ඒ වාගේම බදුල්ල - නුවරඑළිය දිස්ත්‍රික් මායිම බව දක්වන මාර්ග සංවර්ධන අධිකාරියේ පුවරුවක් සවි කර තිබුණා.**



එම අවස්ථාවේ බස් රථය හා අවට ගෝණ්නු රාශියක් අපට දැක ගන්නට හැකි.

වුණා.අපි දහවල් ආහාරය ලබා ගත්තේ ලෝකාන්තයේදි.ඒ සවස 5.00 ට පමණ. වෙහෙස වුවත් අපි දිවා ආහාර ලබා ගන්තා. පරිසරය පිරිසිදුව තබා ගැනීමට ද අප බෙහෙවින් සැලකිලිමත් වුණා.

ඉතින් අපි අපේ රටේ සුන්දර ස්ථාන නරඹන අතර තුර දී ඒම ස්ථාන ආරක්ෂා කළ යුතුය. අනාගත පරපුරට එම ස්ථාන නැරඹීමට අවස්ථාව ලබා දිය යුතුය. මේ ආදර්ශය සිතේ තබා ගෙන ලෝකාන්ත චාරිකාව අපි ගිය හොදම චාරිකාව යැයි සිතා අපි සැවොම නුවරඑළියෙන් පිටත් වුණා.



# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.
මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.
මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දි තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්